# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2069/20 – 2018 මැයි මස 02 වැනි බදාදා – 2018.05.02**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභා කාර්ය පරිපාටික රීති 40(1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි**

බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමණාකරණ විශේෂ විධිවිධාන ප්‍රඥප්තිය නම් වූ මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන ප්‍රඥප්ති කෙටුම්පත සඳහා බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය

අමාත්‍ය මණ්ඩල තීරණ අංක VI/94/09/-2017-02 (i) හා 2017.10.04 දිනැතිව ලැබී ඇති බවත් එය බස්නාහිර පළාත් සභාවේ අනුමැතිය සඳහා මවිසින් යෝජනා කරන්නට නියමිත බවත් මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

**ඉසුර දේවප්‍රිය,**
බස්නාහිර පළාත්, ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන,
ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු,
ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරය,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කෙටුම්පතකි

## බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමණාකරණ විශේෂ විධිවිධාන ප්‍රඥප්තිය

බස්නාහිර පළාත තුළ අපද්‍රව්‍ය කළමනාකරණට අදාළව බස්නාහිර පළාතේ 2007 අංක 1 දරන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තියෙන් සංස්ථාපිත බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ක්‍රමෝපායන් පළාත් පාලන ආයතන මට්ටමින් බල ගැන්වීම සඳහා ද පළාත් පාලන ආයතන විසින් එක්රැස් කළ යුතු වීථිවල තිබෙන අපද්‍රව්‍ය නිවාසවල තිබෙන අපද්‍රව්‍ය නිසි හා යෝග්‍ය ක්‍රියාමාර්ග යටතේ බැහැර කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද පළාත් පාලන ආයතන විසින් එක්රැස් කළ යුතු වීථි වල තිබෙන අපද්‍රව්‍ය නිවාසවල එක්රැස් වන අපද්‍රව්‍ය හැර වෙනත් අපද්‍රව්‍ය පළාත් පාලන ආයතන විසින් භාර ගැනීම සම්බන්ධයෙන් මිලක් නියම කිරීම හා ප්‍රමිති තීරණය කිරීම සඳහා විධිවිධාන සැලසීමට ද බස්නාහිර පළාත තුළ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන් නියාමනය වෙනුවෙන් ගාස්තු නියම කිරීම සඳහා ද විධිවිධාන සැලසීම පිණිස පනවනු ලබන ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය*

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ විශේෂ විධිවිධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර අණ්ඩුකාරවරයා අනුමතය ලබා දුන් දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

02. (1) බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන විසින් යම් ලිඛිත නීතියක් යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව බැහැර කිරීම සඳහා අපද්‍රව්‍ය භාර ගැනීම, එසේ බැහැර කිරීම සඳහා භාරගනු ලබන අපද්‍රව්‍ය පීඩාවක් ඇති නොවන පරිදි බැහැර කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම සහ ඊට අදාළව ලිඛිත නීතිය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් පූර්වාරක්ෂණ විධිවිධාන සැලැස්වීම පළාත් පාලන ආයතනයක කාර්යය වන්නේ ය.

(2) පළාත් පාලන ආයතනයක් විසින් වීථිවල එක්රැස්වන අපද්‍රව්‍ය හා නිවාසවලින් එක්රැස් වන අපද්‍රව්‍ය නොවන වෙනත් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා භාර ගැනීමේ දී අයකළ යුතු ගාස්තු, පෞද්ගලික කසල කළමනාකරණ ව්‍යාපෘති පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් හා වාණිජ හා ව්‍යාපාරික පරමාර්ථයන් වෙනුවෙන් ක්‍රියාත්මක වීමෙන් ජනනයවන කසල සඳහා අය කළ ගාස්තු මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට විය යුතුයි.

*අපද්‍රව්‍ය බැහැර කිරීම වරදක් බව*

03. (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද මෙම ප්‍රඥප්තිය හෝ කවර හෝ ලිඛිත නීතියක් යටතේ පළාත් පාලන ආයතනයක් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙළට හෝ පූර්වාරක්ෂක විධිවිධානයකට අනුකූලව නොවන පරිදි කිසියම් තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට අතින්, බයිසිකලයකින්, ට්‍රයිසිකලයකින්, කරත්තයකින් හෝ සතෙකු මගින් රැගෙන යාමක්, එසේ රැගෙන යන අපද්‍රව්‍ය වීථියක කවර හෝ පොදු ස්ථානයක තබා යාමක් බැහැර කිරීමක් හෝ වීථියකට පොදු ස්ථානයකට එසේ බැහැර වන පරිදි වූ යොමු කිරීමක් වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙහි අධ්‍යක්ෂ විසින් නිශ්චිතව බලය පවරන ලද පළාත් පාලන ආයතනයක නිලධාරියෙකු, අධිකාරියේ නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු විසින් පැමිණිලි කිරීමක දී අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපන්දහසකට නොඅඩු හෝ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොඅඩු මාස හයකට නොවැඩි සිර දඬුවමකට හෝ ඒ දෙයාකාරයෙන් දඬුවමකට යටත් විය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද මෙම ප්‍රඥප්තිය හෝ කවර හෝ ලිඛිත නීතියක් යටතේ පළාත් පාලන ආයතනයක් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙළට හෝ පූර්වාරක්ෂක විධිවිධානයකට අනුකූල නොවන පරිදි කිසියම් තැනැත්තෙකු විසින් අපද්‍රව්‍ය එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට මෝටර් වාහනයකින් හෝ බෝට්ටුවකින් රැගෙන යාමක්, ප්‍රවාහනය කිරීමක් හෝ ඒ ආකාරයෙන් වූ ක්‍රියාමාර්ග යටතේ වීථියකට හෝ පොදු ස්ථානයක තබා යාමක්, බැහැර කිරීමක් හෝ පොදු ස්ථානයක හෝ පෞද්ගලික ස්ථානයක එක් රැස් කිරීමක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් නිශ්චිතව බලය ලබා දෙන පළාත් පාලන ආයතනයක නිලධාරියෙකු, අධිකාරියේ නිලධාරියෙක් හෝ

පොලිස් නිලධාරියෙකු විසින් පැමිණිලි කිරීමක දී අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් එම වරදට වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහසකට නොඅඩු හෝ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොඅඩු වසරකට නොවැඩි සිර දඬුවමකට හෝ ඒ දෙයාකාරයෙන් වූ දඬුවමකට යටත් විය යුතු ය.

(3) යම් තැනැත්තෙකු මෙම වගන්තිය යටතේ තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ අවස්ථාවක එම වරද සිදුකිරීමෙහි ලා යොදා ගනු ලැබූ රජයේ දේපළ නොවන්නා වූ සියලු මෙවලම්, වාහන සහ උපකරණ ඒ වරද සඳහා නිශ්චිත වූ දඬුවමකට අතිරේකව වරදකරු බවට පත්කරන ලද මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවක් මගින් රාජසන්තක කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද යම් අවස්ථාවක දී ඒ වරද සිදුකිරීමෙහි ලා යොදා ගනු ලැබූ මෙවලම්, වාහන, උපකරණ වල අයිතිකරු තුන්වන පාර්ශවයක්වන විටක, වරද කිරීමෙහි ලා අවස්ථාවෝචිත පරිදි ඒ මෙවලම්, වාහන, උපකරණ පාවිච්චි කිරීම වලක්වාලීම සඳහා සියලු පූර්වාරක්ෂණ ක්‍රියාමාර්ග තමා විසින් යොදාගනු ලැබූ බවට හෝ තමාගේ අනුදැනුමකින් තොරව සිදුකර ඇති බවට අධිකරණය සෑහීමකට පත්වන පරිදි එකී අයිතිකරු විසින් ඔප්පු කරනු ලැබුවහොත් රාජසන්තක කිරීමේ ආඥාවක් කරනු නොලැබිය යුතුය.

(4) බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙහි අධ්‍යක්ෂක විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද පළාත් පාලන ආයතනයක බලය ලත් නිලධාරියෙකු වෙතින් ලබාගත් බලපත්‍රයක් යටතේ හෝ පළාත් පාලන ආයතනයක් හෝ ඒ වෙනුවෙන් අපද්‍රව්‍ය බැහැර කිරීමේ කාර්යයන්හි නිරත කවර හෝ තැනැත්තෙකු සම්බන්ධයෙන් මෙම වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(5) මෙම වගන්තිය යටතේ අයකරනු ලබන දඩ මුදල අවස්ථාවෝචිත පරිදි අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙහි හෝ අදාළ පළාත් පාලන ආයතනයෙහි අරමුදලට බැර විය යුතුය.

04. (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද බස්නාහිර පළාත තුළ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන් පළාත් පාලන ආයතන මගින් ක්‍රියාත්මක කිරීම හා ඊට අවශ්‍ය පහසුකම් අධිකාරිය තීරණය කරන පරිදි පළාත් පාලන ආයතන වෙත ලබා දීම බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙහි කාර්යය වන්නේ ය. අධිකාරිය විසින් ක්‍රමෝපායන් තීරණය කිරීම

(2) බස්නාහිර පළාත තුළ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම හා ඊට අවශ්‍ය වන පහසුකම් පළාත් පාලන අයතන වෙත ලබා දීම වෙනුවෙන් දරන්නට වන පිරිවැය වෙනුවෙන් සහ එක් එක් පළාත් පාලන ආයතන බල ප්‍රදේශ වඩාත් පිවිතුරු වූ සංචරණයට හිතකර පරිසරයක් පවත්වාගෙන යාම සඳහා නිශ්චිත පරිශ්‍රයන් වෙනුවෙන් මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන නිර්නායකයන්ට අනුකූලව හා අනුප්‍රමාණයන්ට යටත් වූ ගාස්තුවක් බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් අයකරනු ලැබිය හැකි අතර එසේ අයකරනු ලබන මුදල් බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් මෙම වගන්තිය යටතේ වූ පරමාර්ථයන් වෙනුවෙන් අධිකාරියේ අරමුදලට රැස්කළ යුතු ය.

05. (1) මෙම ප්‍රඥප්තියේ අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහාත් හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහාත් රීති සෑදිය යුතු යැයි මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති සියලුම කරුණු ක්‍රියාත්මක කිරීම සඳහාත් අමාත්‍යවරයා විසින් රීති සෑදිය හැකි ය. රීති සෑදීමේ බලය

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය පළවූ දිනයේ සිට හෝ *ගැසට් පත්‍රයේ* සඳහන් ඉදිරි දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද රීති *ගැසට් පත්‍රයේ* පළ වීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව එකී රීති අනුමත කර එකී අනුමැතිය පිළිබඳව *ගැසට් පත්‍රයක්* මගින් නිවේදනය කළ යුතු ය.

ඒ අයුරින් අනුමත කරනු නොලැබුවහොත් ඒ බව ද *ගැසට් පත්‍රයක්* මගින් නිවේදනය කළ යුතු අතර එදින සිට එම රීතිය යටතේ එතෙක් ගන්නා ලද ක්‍රියාමාර්ගයන්ට අගතියකින් තොරව පරිච්ඡින්න වූවා සේ සැලකිය යුතු ය.

අර්ථ නිරූපණය

06. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියේ

" අමාත්‍යවරයා" යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා ද,

" බලයලත් නිලධාරියා" යන්නෙන් බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකු හෝ පළාත් පාලන ආයතනයක විධායක ප්‍රධානියෙකු විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරන නිලධාරියෙකු,

" පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් ප්‍රාදේශීය සභාවක්, නගර සභාවක් මහ නගර සභාවක් හෝ ඒ වෙනුවෙන් බලතල ක්‍රියාත්මක කරන කවර හෝ අධිකාරීත්වයක්,

" පොලිස් නිලධාරියෙකු" යන්නෙන් උප පොලිස් පරීක්ෂකයෙකු හෝ ඊට උසස් නිලයක් දරන පොලිස් සේවයේ නිලධාරියෙකු,

" වාහනයක්" යන්නෙන් මෝටර් වාහන ආඥාපනතේ දී ඇති අර්ථයම,

" අපද්‍රව්‍ය" යන්නෙන්, මිනිසාගේ පැවැත්මට හා සෞඛ්‍යට හිරිහැර, තර්ජන හා කරදර ගෙනදෙන හෝ කාලයත් සමග එසේ වීමට ඉඩ ඇති, ඉවතලන දෑ, ප්‍රමාණයෙන් විශාල වූ ඉවතලන දෑ, අළු, ගොහොරු, මඩ, ඉවතලන තෙල්, සත්ත්ව සහ මිනිස් මළපහ, ඉවතලන ආම්ලික හා භාෂ්මික දෑ සත්ත්ව මළ කුණු වැනි වැදගත් නොවන ශේෂ වූ දෑ සහ නාගරික අපද්‍රව්‍ය මෙහි ලා ගැනේ.

" වීථියක්" යන්නෙන් මංමාවතක්, පොදු පාරක්, දෙපාර්ශවයක් හෝ ඊට වඩා ප්‍රවේශ අයිත්වාසිකම් ඇති පෞද්ගලික පාරක්, කවර හෝ මංමාවතකට, පාරකට අදාළ කාණුවක්, දුම්රිය මාර්ගයක්, උමං මාර්ගයක්, ඇළ, දොළ, ගංගාවක්

"බෝට්ටුව" යන්නෙන් ජලය මත යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන ආකාරයෙන් ජලය මත පැද යා හැකි කවර හෝ මෙවලමක් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

7. ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ පාඨ අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

05 - 468

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.